තනතුරු පුරප්පාඩුව

වැවිලි හා ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශය

ශ්‍රී ලංකා තේ මණ්ඩලය

ශ්‍රී ලංකාවේ තේ කර්මාන්තයේ නියාමන, සංවර්ධන සහ අලෙවි ප්‍රවර්ධන කටයුතු ඉටුකිරීම සඳහා ක්‍රියාත්මක වන ප්‍රමුඛතම රාජ්‍ය ආයතනය වන ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ අනුමත සේවක සංඛ්‍යාව තුළ පවතින අධ්‍යක්ෂ (පරිපාලන හා මානව සම්පත්) තනතුරෙහි පුරප්පාඩුව පිරවීම සඳහා නියමිත සුදුසුකම් සපුරා ඇති කාර්යශීලි, උද්යෝගිමත් හා විචක්ෂණශීලි ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

අධ්‍යක්ෂ - පරිපාලන හා මානව සම්පත් - තනතුර - HM (1-1)

රැකියා පිරිවිතරය :

ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ සභාපති සහ අධ්‍යක්ෂ ජනරාල්ගේ අධීක්ෂණය යටතේ මණ්ඩලීය පරිපාලන කටයුතු (ප්‍රවාහන, ආරක්ෂක, පුස්තකාලය සහ නඩත්තු කටයුතු) සහ මානව සම්පත් කළමණාකරන හා සංවර්ධන කටයුතු ඉටුකිරීම සහ කාර්ය සාධන ඇගයීම් සඳහා ආයතනයේ භෞතික හා මූල්‍ය ඉලක්ක පසුවිපරම් කිරීම හා විශ්ලේෂණය කිරීම.

අධ්‍යාපන සුදුසුකම් හා පළපුරුද්ද :

බාහිර අයදුම්කරුවන්

(අ) ශ්‍රී ලංකා විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් කළමණාකරණය/රාජ්‍ය පරිපාලනය/ව්‍යාපාර පරිපාලනය/මානව සම්පත් කළමණාකරන /නීතිය යන විෂයන්ගෙන් එකක් යටතේ ලබාගත් ප්‍රථම උපාධිය

සමඟ

කළමණාකරණය හෝ රාජ්‍ය පරිපාලන හෝ ව්‍යාපාර පරිපාලනය යන විෂයන් එකක් සම්බන්ධයෙන් අවම වශයෙන් පශ්චාත් උපාධියක් ලබා තිබීම

සහ

ප්‍රථම උපාධි සුදුසුකම ලැබීමෙන් අනතුරුව පරිපාලනය සහ මානව සම්පත් කළමණාකරන ක්ෂේත්‍රයෙහි පිළිගත් ආයතනයක අවම වශයෙන් අවුරුදු 15 ක කළමනාකරණ මට්ටමේ පළපුරුද්දක් ලබා තිබීම.

අභ්‍යන්තර අයදුම්කරුවන්

(අ) උක්ත බාහිර බාණ්ඩය යටතේ දක්වා ඇති සුදුසුකම සපුරා තිබීම.

(ආ) ශ්‍රී ලංකා තේ මණ්ඩලයෙහි මධ්‍යම කළමනාකරණ (MM) 1 ශ්‍රේණියේ අදාල ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර 05 සතුටුදායක සේවා කාලයක් සපුරා තිබීම.

වැටුප් පරිමාණය :

HM1-1 02/2016 රු. 140,640 - 15 × රු. 4,100 - රු. 202,140/-

කළමනාකරණ සේවා චක්‍රලේඛ 01/2025 හි 1 ප්‍රතිපාදන අනුව **රු. 123,019/-** ආරම්භක මාසික වැටුප මත පිහිටුවා වැටුප් ගෙවීමට කටයුතු කරනු ලැබේ.

වයස් සීමාව :

අවුරුදු 35 ට නොඅඩු සහ අවුරුදු 50 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන්ට මෙම උපරිම වයස් සීමාව බල නොපැවැත්වේ.

වෙනත්/පොදු ප්‍රතිලාභ:

- තෝරාගනු ලබන අයදුම්කරුවන් ඔහුගේ/ඇයගේ වැටුපෙන් 10% ක් සේවක අර්ථසාධක අරමුදලේ දායකත්වය සඳහා ගෙවිය යුතු අතර මණ්ඩලය ඒ සඳහා 15% කින් දායක වනු ඇත.
- මණ්ඩලය තවදුරටත් සේවා නියුක්ත භාර අරමුදලට ඔහුගේ/ඇයගේ වැටුපෙන් 3% කින් දායක වනු ඇත.

පොදු කොන්දේසි :

- සියලු අයදුම්කරුවන් ශ්‍රී ලාංකික පුරවැසියන් විය යුතුය.
- සියලු අයදුම්කරුවන් දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍යවන කායික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත මනා සෞඛ්‍ය තත්ත්වයකින් පරිපූර්ණ විය යුතුය.
- සියලුම අයදුම්කරුවන් මනා චරිතයකින් හෙබි පුද්ගලයින් විය යුතුය.
- තෝරා ගනු ලබන බාහිර අයදුම්කරුවන් වසර 03 ක පරිවාස කාලයකට යටත්ව බඳවා ගනු ලබන අතර, තනතුරෙහි ස්ථිර කරන ලද අභ්‍යන්තර අයදුම්කරුවන් වසරක පරීක්ෂණ කාලයකට යටත්ව පත්කිම සිදුකරනු ලැබේ.
- සියලු තෝරා ගනු ලබන බාහිර අයදුම්කරුවන් අදාල වැටුප් පරිමාණයේ ආරම්භක වැටුප් තලයේ පිහිටවනු ඇත.
- අභ්‍යන්තර අයදුම්කරුවන් අදාල තනතුරු සඳහා තෝරා ගතහොත් දැනට පවතින ආයතන සංග්‍රහයේ vii වන පරිච්ඡේදයේ විධිවිධාන අනුව නියමිත වැටුප් පරිමාණයේ අදාල වැටුප් පියවර මත පිහිටුවනු ලැබේ.

අයදුම් කිරීම:-

රජයේ දෙපාර්තමේන්තු රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩලවල සේවයේ නියුතු අයදුම්කරුවන් ආයතන ප්‍රධානීන්ගේ නිර්දේශයද සහිතව තම අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය.

මෙම කාර්යාලයෙන් හෝ **http://www.srilankateaboard.lk** වෙබ් අඩවියෙන් ලබාගත් නියමිත ආකෘති පත්‍රය පරිදි සකස් කරන ලද අයදුම්පත් උප්පැන්න සහතිකයේ සහ සුදුසුකම් හා පළපුරුද්ද පිළිබඳ සහතිකවල පිටපත් සමඟ **2026 ජූනි 12** වන දිනට පෙර ලැබෙන සේ පහත සඳහන් ලිපිනයට ලි.ප.තැ. එවිය යුතුය. අයදුම්පත් බහාලන කවරයේ වම්පස ඉහල කෙලවරේ අයදුම්කරන තනතුර සඳහන් කළ යුතුය.

ලේකම්,
වැවිලි හා ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශය,
දෙවන අදියර
11 මහල, සෙත්සිරිපාය,
බත්තරමුල්ල.